## ඊශ්‍රායලයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියා සඳහා අවශ්‍ය කරන මූලික සුදුසුකම්.

## (පිරිමි අයදුම්කරුවන් සඳහා පමණි)

සියලුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

- වයස අවුරුදු 25-50 අතර පිරිමි අයදුම්කරුවෙකු විය යුතුය.
- වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
- නිෂ්පාදන ක්ෂේත්‍රයේ අවම වසර 03කට වැඩි පලපුරුද්ද ලබා තිබීම. (ඇගලුම්, ඉලෙක්ට්‍රොනික්, ලෝහ, රසායන ද්‍රව්‍ය, ආහාර, දැව හා කඩදාසි, ප්ලාස්ටික්, රබර් වැනි නිෂ්පාදන කර්මාන්ත ශාලා) (වසරක් සඳහා ලකුණු 15ක් හිමි වේ.)
- ශ්‍රී ලංකාවේ වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම. (ලකුණු 10ක් හිමි වේ.)
- ක්ෂේත්‍රයට අදාලව වෘත්තීය සුදුසුකම් ලබා තිබීම (සනාථ කිරීමට සහතික ඉදිරිපත් කළ යුතුය.) (ලකුණු 15 ක් හිමි වේ.)
- සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 70ක් ලබා ගත යුතුය.
- ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් ද්විතීක මට්ටමේ දැනීමක් තිබිය යුතු අතර ඉංග්‍රීසි භාෂාවේ අදහස් හුවමාරු කර ගැනීම, කියවීම, සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් කියවා තේරුම් ගැනීමේ හැකියාවද තිබිය යුතුය. විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් පවත්වනු ලබන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව හෝ ඒ හා සමාන වෙනත් පිළිගත් ආයතනයක් මඟින් පැය 60 හෝ ඊට වැඩි ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පාඨමාලාවක් හැදෑරීමෙන් ලබාගත් කුසලතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.
- 10 වන ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලබා තිබීම.
- අයදුම්කරුවන් මීට පෙර ඊශ්‍රායලයේ රැකියාවක නිරත වී නොතිබිය යුතුය.
- අයදුම්කරුගේ කාලත්‍රයා, දරුවන් හා සහෝදර සහෝදරියන් මේ වන විට ඊශ්‍රායලයේ රැකියා කරමින් හෝ රැඳී නොසිටිය යුතුය.
- මනා සෞඛ්‍ය තත්වයකින් පසු විය යුතු වන අතර ආහාර හා පිරිසිඳු කිරීමේ ද්‍රාවණ වලින් සිදුවන ආසාත්මිකතා වලින් තොර විය යුතුය. එසේම නිදන්ගත රෝග, වෙනත් රෝග, ක්ෂය රෝගය, සෙංගමාලය, සිපිලික්ස්, ගොනෝරියා හා ඒඩ්ස් වැනි රෝග වලින් නොපෙලෙන්නෙකු වීම.
- ශ්‍රී ලංකාව තුලදී පිරිසිදු පොලිස් වාර්තාවක් ලබා ගැනීමේ හැකියාව හා අයදුම්කරු වෙනත් රටක මාස 6කට වැඩි කාලයක් සේවය කර ඇත්නම් එම රටෙන්ද පොලිස් වාර්තාවක් ලබා ගැනීමේ හැකියාව තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරු මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ඉතිහාසයක් නොතිබිය යුතුය.
- ඊශ්‍රායල් PIBA ආයතනය විසින් වරින් වර නියම කරනු ලබන අනෙකුත් සියලුම අවශ්‍යතා සපුරාලීමට කටයුතු කල යුතුය.